# ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රථමතාව හා එයට බලපෑ හේතු පිළිබඳ විමසුමක්

ආර්. ජේ. එම්. උඩුපෝරුව

**සාරාංශය**

සංවර්ධනය වෙමින් පවතින රටවල ජනාවාස පද්ධතිය පිළිබඳ ව සළකා බලන විට එම රටවල ජනාවාස පද්ධතියේ නාගරික ප්‍රථමතාව එනම් එක් නගරයක් අනේ සියලු නගර අභිභවා වර්ධනය වීම බෙහෙවින් ම පොදු ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකි ය. ජනාවාස පද්ධතියේ නාගරික ප්‍රථමතාව සහිත බොහෝ රටවල අත්දැකීම් අනුව එක් නගරයක් පමණක් ප්‍රමුඛත්වය ගැනීම එරටෙහි අවකාශීය සංවර්ධනයේ විශාල විෂමතාවක් ඇති කිරීම ට හේතු වේ. ශ්‍රී ලංකාවේ ජනාවාස පද්ධතිය තුළ ද දීර්ඝ කාලයක් තිස්සේ නාගරික ප්‍රථමතා ලක්ෂණය පැහැදිලි ව හඳුනා ගත හැකි අතර එය ශ්‍රී ලංකාවේ අවකාශීය සංවර්ධනයේ විශාල විෂමතාවයක් ඇති කිරීම ට ප්‍රබල ලෙස බලපා ඇත. මේ අනුව මෙම ලිපියෙහි ප්‍රධාන පරමාර්ථ වන්නේ ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රථමතාවයේ ස්වභාවය හඳුනා ගැනීම සහ නාගරික ප්‍රථමතාවය ට බල පෑ හේතු හඳුනා ගැනීම ය. මේ සඳහා දත්ත සහ තොරතුරු ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව, මහ බැංකු වාර්තා, විශ්වවිද්‍යාල විද්වතුන්ගේ පර්යේෂණ ලිපි සහ අන්තර් ජාලයේ වෙබ් අඩවි මගින් රැස් කරනලදී.

දත්ත හා තොරතුරු විශ්ලේෂණයට අනුව ශ්‍රී ලංකාවේ ප්‍රථමතාවට ප්‍රධාන හේතු ලෙස හඳුනා ගත හැකි හේතු ගනණාවක් තිබුණ ද ශ්‍රී ලංකාව යටත් විජිතයක් ලෙස පැවැතීම ප්‍රධාන හේතුව ලෙස කැපී පෙනේ. තනි නගරයක් ලෙස කොළඹ නගරයේ ප්‍රථමතාවය 1931 දක්වා පමණ කැපී පෙනුණ ද එයින් පසුව කොළඹ නගරය උපනගරෝපාන්තකරණයට ලක් වීම නිසා කොළඹ තනි නගරයක් ලෙස තිබූ ප්‍රථමතාව වර්ථමානය වන විට කොළඹ පුරවර ප්‍රථමතාවය බවට පත් වී ඇත. මේ අනුව වර්ථමානයේ කොළඹ පුරවර ප්‍රදේශය ශ්‍රී ලංකාවේ හර ප්‍රදේශය වශයෙන් වර්ධනය වී ඇති අතර පැහැදිලි පර්යන්තයක් ද නිර්මාණය වී ඇත.

## හැඳින්වීම

ඕනෑම රටක නාගරික ජනාවාස පිළිබඳ සළකා බලන විට එහි එක්තරා ධූරාවලියක් හඳුනා ගත හැකි අතර මෙම ධූරාවලිය තුළ විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත නගර රාශියක් පවතී. නගරවල ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධානතම නිර්ණායකය වන්නේ ජනසංඛ්‍යාව යි. විවිධ ජනසංඛ්‍යා ප්‍රමාණයන්ගෙන් යුක්ත නගර රටක නාගරික ධූරාවලියක් තුළ පවතී. මෙහි දී සාමාන්‍යයෙන් රටක ජනසංඛ්‍යාව පදනම් කොට ගෙන නගර ප්‍රමාණ තුනකින් හඳුනා ගනු ලබයි. එනම් විශාල පරිමාණ නගර (cities), මධ්‍ය පරිමාණ නගර (intermediate size towns) හා කුඩා පරිමාණ නගර (small towns) වශයෙනි. ක්‍රිස්ටාලර්ගේ (Christaller,1936) කේන්ද්‍රස්ථානවාදය අනුව රටක නගර පද්ධතියේ විශාල ප්‍රමාණයේ නගර ඉතා ස්වල්පයක් පවතින අතර මධ්‍ය ප්‍රමාණයේ නගර ඊට වඩා වැඩි වන අතර කුඩා ප්‍රමාණයේ නගර මධ්‍යම ප්‍රමාණයේ නගරවලට ත් වඩා වැඩි වශයෙන් පවතී.

මේ ආකාරයට නගරවල වාසය කරන ජනසංඛ්‍යාව පදනම් කර ගනිමින් නගරවල ප්‍රමාණ ව්‍යාප්තිය පිළිබඳ ව විස්තර කළ හැකි අතර ලෝකයේ විවිධ රටවල පවතින නගරවල ප්‍රමාණ ව්‍යාප්තීන් පදනම් කොට ගෙන නගර ප්‍රමාණ ව්‍යාප්තිය පිළිබඳ ව ප්‍රධාන වශයෙන් රටාවන් තුනක් නොහොත් නියාමයන් තුනක් හඳුනාගෙන ඇත. එනම්,

ප්‍රථමතා රටාව (Primate city pattern)
තරාතිරම නියාමය (Rank size rule)
ද්විමය රටාව (Binary pattern) ලෙස ය.

විවිධ රටවල නගර ප්‍රමාණ ව්‍යාප්තිය පිළිබඳව අධ්‍යයන වලින් පසු 1939 දී මාර්ක් ජෙපර්සන් (Mark Jefferson) විසින් ප්‍රථමතා රටාව හඳුන්වා දෙන ලදී. යම් කිසි රටක එක් නගරයක් එනම් බොහෝ විට එහි අග නගරය අනෙකුත් සියලු නගර අභිභවා වර්ධනය වීම නාගරික ප්‍රථමතාවය වශයෙන් හැඳින්වේ. මෙම තත්ත්වය ඇති වන්නේ එක් නගරයකට විශාල ජනසංඛ්‍යාවක් ඒකරාශී වීමෙනි (United Nation,2004). මෙහි දී සංඛ්‍යාත්මක වශයෙන් එහි විශාලත්වය පෙන්නුම් කරන්නේ නම් දෙවන විශාලතම නගරයේ ජනසංඛ්‍යාව මෙන් දෙගුණයකටත් වඩා වැඩි ජනසංඛ්‍යාවක් හෝ විශාලතම නගරයේ ජනසංඛ්‍යාවෙන් අඩකටත් වඩා අඩු ජනසංඛ්‍යාවක් දෙවන විශාලතම නගරයේ වාසය කළ යුතු යි. මේ අනුව පළමු

විශාලතම නගරය හා දෙවන විශාලතම නගරය අතර ජනසංඛ්‍යාවේ ඉතා විශාල පරතරයක් පවති. මෙම නගරය රටක ජනාවාස පද්ධතිය තුළ ජනසංඛ්‍යාවේ විශාලත්වයෙන් පමණක් නොව ආර්ථික, සමාජ, දේශපාලනික, වශයෙන් ද ආධිපත්‍යයක් දරයි.

නගර ප්‍රමාණ ව්‍යාප්තිය පිළිබඳ "තරාතරම නියාමය" ජෝර්ජ් ස්විෆ් (George Zipf) නැමැත්තා විසින් 1949 දී හඳුන්වා දෙන ලදී. මොහු විවිධ ප්‍රමාණවලින් යුක්ත නගර එක්තරා අනුපිළිවෙලකට පිහිටුවා ඒවායේ තරාව (rank) සහ තරම (size) අතර තිබෙන සම්බන්ධතාවය කෙබඳුදැයි හඳුනා ගැනීමට උත්සාහ කරන ලදී. මේ අනුව ඔහු ඉදිරිපත් කරනු ලැබූ නිගමනය වන්නේ, දෙවන නගරයේ ජනසංඛ්‍යාව විශාලතම නගරයේ ජනසංඛ්‍යාවෙන් එනම් ප්‍රමාණයෙන් පළමු තැන ගන්නා නගරයේ ජනසංඛ්‍යාවෙන් $^1/_2$ ක් විය යුතු අතර තුන්වන විශාලතම නගරයේ ජනසංඛ්‍යාව පළමු විශාලතම නගරයේ ජනසංඛ්‍යාවෙන් $^1/_3$ ක් ද හතරවන විශාලතම නගරයේ ජනසංඛ්‍යාව පළමු විශාලතම නගරයේ ජනසංඛ්‍යාවෙන් $^1/_4$ ක් ද පස්වන විශාලතම නගරය $^1/_5$ ක් ද ආදි වශයෙන් එක්තරා ක්‍රමානුකූල රටාවකට පිහිටන බවයි.

මෙයට අමතරව නගර ප්‍රමාණ ව්‍යාප්තිය පිළිබඳ තවත් රටාවක් වන්නේ ද්විමය රටාවයි (Binary Pattern), මෙහි දී රටක ජනාවාස පද්ධතිය තුළ එක් විශාලතම නගරයක් පමණක් ප්‍රමුඛත්වය ගන්නවා වෙනුවට එවැනි ම ප්‍රමාණයෙන් විශාල වූ නගර දෙකක් හෝ කිහිපයක් ප්‍රමුඛතාවය ගැනීම අදහස් වේ. මෙහි දී පළමු විශාලතම නගරය හා දෙවන විශාලතම නගරය අතර ජනසංඛ්‍යාවේ විශාල පරතරයක් දක්නට නොලැබේ මේ අකාරයට නගර ප්‍රමාණ ව්‍යාප්තිය පිළිබඳ ප්‍රධාන රටා 03ක් හඳුනා ගත හැකි අතර එක් එක් රටවල සමාජ, ආර්ථික හා දේශපාලන යන අංශවලට සම්බන්ධ විවිධ සාධක අනුව විවිධ රටා තීරණය වේ.

ප්‍රථමතා රටාව (Primate city pattern) නොහොත් නාගරික ප්‍රථමතාවය (Urban primacy) සංවර්ධනය වන රටවල බෙහෙවින් ම පොදු ලක්‍ෂණයක් වුව ද සංවර්ධිත රටවල ද මෙම තත්ත්වය හඳුනා ගත හැකි ය. විශේෂයෙන් අප්‍රිකා හා ආසියානු කලාපීය රටවල ජනාවාස පද්ධතියේ පොදු ලක්‍ෂණයක් ලෙස මෙය හඳුනා ගත හැකි ය. 1950 දශකයට පෙර මෙම ලක්‍ෂණය බොහෝ සංවර්ධිත රටවල දක්නට ලැබුණ ද 1950න් පසු තුන්වන ලෝකයේ රටවල ද සීඝ්‍රයෙන් නාගරීකරණය

ව්‍යාප්ත වීමට පටන් ගැනීමත් සමග ප්‍රථමතා නගර බිහි වන්නට විය. මෙම රටවල ප්‍රථමතා නගරවල නාගරික පහසුකම් වර්ධනය වීමත් සමග එම පහසුකම් ලබාගැනීමේ අරමුණින් විශාල වශයෙන් ග්‍රාමීය-නාගරික සංක්‍රමණ ඇති වූ අතර මෙය බොහෝ තුන්වන ලෝකයේ රටවල සංවර්ධනයේ අසමතුලිතතාවයක් ඇති කිරීම ට හේතු විය. මෙම තත්ත්වය 1950න් පසුව ප්‍රථමතා නගර වර්ධනය කෙරෙහි ජාත්‍යන්තර අවධානය යොමු වීම ට හේතු විය.

ලෝකයේ ප්‍රථමතා නගර සම්බන්ධ ව බොහෝ රටවල පවතින අත්දැකීම් පිළිබඳ ව සළකා බැලීමේ දී ඉතා පැහැදිලි ව අනාවරණය වන කරුණක් වන්නේ රටක ජනාවාස පද්ධතියේ ප්‍රථමතා නගරයක් බිහිවීම රටක ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතාවයන් ඇති කිරීමට බෙහෙවින් හේතු වන බවය. බොහෝ විට රටක අග නගරය ප්‍රථමතා නගරයක් වන අතර එය එම රටෙහි හර ප්‍රදේශය ලෙස වර්ධනය වේ. නිරන්තරයෙන් හර ප්‍රදේශය සම්පත් හා ශ්‍රමය සඳහා පර්යන්තය මත රඳා පවතින කේන්ද්‍රාභිසාරී බලවේගයක් බවට පත් වේ. මේ අකාරයට රටක සම්පත් මෙන්ම ශ්‍රමය ද උරා ගනිමින් වැඩෙන ප්‍රථමතා නගර නිසා රටක වේගයෙන් වැඩෙන හරයක් සහ මන්දගාමී ලෙස වැඩෙන පර්යන්තයක් නිර්මාණය වන අතර හරය හා පර්යන්තය අතර විශාල සංවර්ධන පරතරයක් ඇති වේ. මෙම තත්ත්වය රටක අවකාශීය සංවර්ධනයේ අසමතුලිතාවය පෙන්නුම් කරන ප්‍රබල සාධකයකි.

එමෙන් ම ප්‍රථමතා නගරයක් වර්ධනය වී සංතෘප්තතාවයට පත් වීමෙන් පසු එයින් විශාල ලෙස ගැටළු මතු කරනු ලබයි. එනම් පරිසර දූෂණය, තදබදය, විවිධ සමාජ අපරාධ, සම්පත් හිඟකම, සමාජ අසහනය, රැකියා විරහිතතාවය, නාගරික දරිද්‍රතාවය මෙන්ම නගරයේ වාසය කරන්නන්ගේ ජීවිතයේ ගුණාත්මක භාවය අඩුවීම ආදී විවිධ ක්ෂේත්‍රවල ගැටළු රාශියක් පැන නගී. මෙන්ම ප්‍රථමතා නගරය විශාල වන විට සේවා හා යටිතල පහසුකම් සඳහා පවතින විශාල ඉල්ලුම සපුරාලීම සඳහා යන වියදම ඉතා විශාලය. රිචඩ්සන් (Richardson, 1993) පවසන පරිදි එය ග්‍රාමීය ප්‍රදේශවල මෙන් හය ගුණයක් පමණ වේ. එබැවින් රටක නාගරික පද්ධතිය තුළ එක් නගරයක් ප්‍රමුඛ වීම එම රට තුළ විවිධ ගැටළු රාශියක් ඇති කරන්නක් වේ.

නාගරික ප්‍රථමතාවය රටක විවිධ ක්ෂේත්‍රවලට බලපාන ගැටළු ඇති කළ ද එය මුළුමනින් ම අයහපත් ප්‍රතිපල ගෙන එනු ලබන්නක් ලෙස තර්ක කළ නොහැකි ය. මෙවැනි විශාල නගරයක හෝ ප්‍රදේශයක විශාල වශයෙන් විවිධ කාර්යයන් සහ

යටිතල පහසුකම් සංකේන්ද්‍රණය වීමෙන් ඇති වන පරිමාණාත්මක ඵල (Economies of scale) නිසා නිෂ්පාදන පිරිවැය අවම වේ. මේ තුළින් විශාල ලෙස නාගරික පහසුකම් ද වර්ධනය වන අතර භාණ්ඩ හා සේවා ද ඒකරාශී වී විවිධ ක්ෂේත්‍ර තුළ විශාල ලෙස රැකියා ජනනයක් ඇති වේ. මෙම තත්ත්වය ග්‍රාමීය ප්‍රදේශවලින් පැමිණි සංක්‍රමණිකයන්ට ඉතා ආකර්ශණීය වේ. රිචඩ්සන් සඳහන් කරන පරිදි ප්‍රථමතා නගර රටක් නවීකරණයේ දී විශාල කාර්යය භාරයක් ඉටු කරනු ලබයි (Richardson, 1993), නවෝත්පාදන, නව ආර්ථික ක්‍රමවේද, නව තාක්‍ෂණික හා සන්නිවේදන ක්‍රමවේද හා උපකරණ ආදිය මූලින් ම පැමිණෙන්නේ මෙම නගරවලට ය. එමෙන්ම ඉහළ ආදායම් ලාභීන් මෙම නගරවලට සංක්‍රමණය වීමෙන් විවිධ භාණ්ඩ හා සේවාවලට විශාල ඉල්ලුමක් ඇති වන අතර එමඟින් නිෂ්පාදන පිරිවැය අවම කරමින් විශාල ලෙස භාණ්ඩ නිෂ්පාදනය මෙන් ම අලෙවි කිරීමේ ඉඩ ප්‍රස්ථා ඇති වන අතර නව ආකල්ප සහිත සමාජයකට ද මඟ පෑදේ. මෙම තත්ත්වය රටකට බලපාන ඵලදායි තත්ත්වයකි.

නාගරික ප්‍රථමතාවය සංවර්ධිත රටවලට සාපේක්‍ෂව සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින්නේ මන්දැයි සොයා බැලීම ද ඉතා වැදගත් වේ. ප්‍රථමතා නගර වර්ධනය වීම සඳහා අවශ්‍යය පසුබිම මනාව සැකසී තිබීම තුන්වන ලෝකයේ රටවල ප්‍රථමතා නගර වැඩි වශයෙන් බිහිවීම කෙරෙහි ඉතා පැහැදිලි ව බලපා ඇති බව පෙනේ. මුත්ලු (Mutlu, 1989) සඳහන් කරන ආකාරයට ප්‍රථමතා නගර බිහිවීම කෙරෙහි හේතු සාධක ගණනාවක් බලපානු ලබයි. එනම් ප්‍රධාන නගරය දේශපාලන මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීම, මධ්‍යගත පරිපාලන ව්‍යුහයක් පැවතීම, යටත් විජිතයක් වශයෙන් පැවතීම, ආර්ථිකය කෘෂි කාර්මික ආර්ථිකයක් වීම, නාගරික මට්ටම, ජනසංඛ්‍යා වර්ධන වේගය හා ජනවාර්ගික විවිධත්වය ආදී සාධක යි. එමෙන්ම ප්‍රථමතා ලක්‍ෂණ රටක නොමැති වීම කෙරෙහි බලපාන සාධක ලෙස ඔහු පෙන්වා දෙන්නේ ඉහළ කාර්මීකරණ මට්ටම, ආර්ථිකය කෘෂිකාර්මික ආර්ථිකයක් නොවීම, වගාකළ හැකි භූමි ප්‍රමාණය, මනාව සැකැසුණ නාගරික ධූරාවලියක් තිබීම, ඉහළ නාගරික මට්ටමක් තිබීම සහ ද්විතීය සහ තෘතීය අංශවල ඉහළ රැකියා ජනනයක් සිදු වීම ආදී සාධක යි.

මුත්ලු (Mutlu, 1989) සඳහන් කරන ආකාරයට නාගරික ප්‍රථමතාවයක් ඇති වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ ව සළකා බලන විට ඉතා පැහැදිලි ව පෙනී යන කරුණක් වන්නේ එම සාධක තුන්වන ලෝකයේ පවතින ලක්‍ෂණ හා මනාව

සැසඳෙන බවයි. උදාහරණයක් වශයෙන් අප්‍රිකානු හා ආසියානු රටවල ප්‍රථමතා නගර ඇති වීම කෙරෙහි මෙම සාධක බොහොමයක් බලපා තිබෙන බව ඉතා පැහැදිලි ව පෙනේ. බේකර් (Becker) 1992 දී කළ අධ්‍යයනයක් අනුව අප්‍රිකා මහාද්වීපයේ බොහෝ රටවල අගනගර හා වරාය නගර බොහොමයක් ප්‍රථමතා ලක්‍ෂණවලින් යුක්තය. 1987 දී අප්‍රිකා මහාද්වීපයේ රටවල් 29 කින් රටවල් 19 කම ජනසංඛ්‍යාවෙන් 10% ක් එක නගරයකට ඒකරාශී වී සිටින ලදී. මේ අනුව ඔහු විසින් අනෙකුත් තුන්වන ලෝකයේ රටවලට වඩා අප්‍රිකා මහාද්වීපයේ රටවල ප්‍රථමතා ලක්‍ෂණය කැපී පෙනෙන බව නිරීක්‍ෂණය කරන ලදී. ඔහු පවසන පරිදි මෙයට ප්‍රධාන හේතුව වන්නේ අප්‍රිකාවේ බොහෝ රටවල් කුඩා ජනසංඛ්‍යාවක් සිටින, අඩු ඒක පුද්ගල ආදායමක් සහිත, කුඩා කෘෂි අතිරික්තයක් පවතින, යටත් විජිතවාදී ඉතිහාසයක් පවතින රටවල් වීමයි. එමෙන් ම බොහෝ අප්‍රිකානු රටවල පවතින සිවිල් යුද්ධමය වාතාවරණයන්, ආර්ථිකමය පසුබැසීම්, විවිධ හේතු මත මිනිසුන් අනාථභාවයට පත්වීම් වැනි හේතු සාධක ද මේ සඳහා බල පා ඇති බව ඔහු තව දුරටත් අනාවරණය කරයි. හැන්ඩර්සන් (Henderson, 1996) පවසන ආකාරයට සම්පත් සීමිත රටවල එක් නගරයක පමණක් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම ද නාගරික ප්‍රථමතාවයට හේතු වේ.

තුන්වන ලෝකයේ රටවල ප්‍රථමතා නගර වර්ධනයේ ඉතිහාසය පිළිබඳ ව සළකා බලන විට ඉතා පැහැදිලි ව පෙනීයන කරුණක් වන්නේ, අගනගර හෝ වරාය නගරවල ප්‍රථමතාවය ඇති වීමට බලපාන ලද ප්‍රධාන සාධකය වන්නේ යටත් විජිතවාදය බවයි. බොහෝ අප්‍රිකා, ආසියා හා ලතින් ඇමෙරිකානු රටවල් යටත් විජිත වශයෙන් බොහෝ කාලයක් යුරෝපීය ජාතීන්ට යටත් වී පැවති අතර එම රටවල ස්වයංපෝෂිත ආර්ථික හා සමාජ, දේශපාලන රටාව බිඳලමින් නව සමාජ, ආර්ථික හා දේශපාලන ව්‍යුහයක් නිර්මාණය කිරීම කෙරෙහි යටත් විජිතකරණය ඉතා දැඩි ලෙස බලපා ඇත. අප්‍රිකා, ආසියා හා ලතින් ඇමෙරිකා රටවල මෙම යටත් විජිතකරණයට පෙර ද නාගරික මධ්‍යස්ථාන පැවතිය ද ප්‍රථමතා ලක්‍ෂණ නොතිබූ අතර යටත් විජිතවාදයේ ආරම්භයෙන් පසුව මෙම රටවල ප්‍රථමතා ලක්‍ෂණ බිහිවිය.

යුරෝපීය ජාතීන් විසින් රටක් යටත් කර ගැනීමෙන් පසු තම මව් රට එනම් අධිරාජ්‍ය සමග සබඳතා පවත්වා ගත හැකි නගරයක් යටත් වූ රටින් තෝරා ගනු ලබන අතර එය බොහෝ විට වරාය සහිත නගරයක් විය. මෙම නගරය "පිවිසුම්

දොරටු නගරයක්" ලෙස (Gateway) ලෙස දිගින් දිගටම පවත්වා ගැනීම නිසා රටේ සමාජ ආර්ථික, දේශපාලන, හා වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් මෙය ක්‍රමයෙන් වර්ධනය වේ. රට අභ්‍යන්තරයේ පවතින සම්පත් එනම් කෘෂිකාර්මික භෝග හෝ වෙනත් ඛණිජ ද්‍රව්‍ය ඒකරාශී කිරීම සඳහා වෙනත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන කෘෂි ද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථාන ලෙස දියුණු කළ අතර ඒවා ප්‍රවාහන ජාලය මඟින් තෝරා ගන්නා ලද පිවිසුම් දොරටු නගරය සමග සම්බන්ධ කරන ලදී. මෙම ද්‍රව්‍ය තෝරා ගන්නා ලද පිවිසුම් දොරටු නගරයේ වරාය මඟින් තම මව් රටට යවන අතර නිෂ්පාදිත භාණ්ඩ යටත් විජිත කරා ගෙන එන්නේ ද එම පිවිසුම් දොරටු නගරය හරහා ය. මෙලෙස මෙම නගර ක්‍රමයෙන් එම රටෙහි ප්‍රධාන නගර වශයෙන් ද, ආර්ථික, සමාජ, දේශපාලන මධ්‍යස්ථාන වශයෙන් ද ප්‍රමුඛ වී අනෙකුත් සියලු නගර අභිබවා වර්ධනය වන්නට වේ. මෙම නගරවල සාපේක්ෂ වශයෙන් අඩු සාපල්‍යතාවයක් පැවතිය ද නිරන්තරව සිදුවන ග්‍රාමීය-නාගරික සංක්‍රමණ නගර වර්ධනයට බල පෑ ප්‍රධානතම සාධකය යි (Miller, 2001).

වගුව 01

ලෝකයේ ප්‍රථමතා නගර කිහිපයක්

| රට | ප්‍රථමතා නගරය | ජනසංඛ්‍යාවේ විශාලත්වය |
|---|---|---|
| තායිලන්තය | බැංකොක් | දෙවන විශාලතම නගරය Sumut Prakan මෙන් 35 ගුණයක් විශාලය |
| උගන්ඩාව | කම්පාලා | දෙවන විශාලතම නගරය Jinja මෙන් 11 ගුණයක් විශාලය |
| ඉතියෝපියාව | උඩිස් අබාබා | දෙවන විශාලතම නගරය Dirc Dawaමෙන් 10 ගුණයක් විශාලය |
| පේරු | ලීමා | දෙවන විශාලතම නගරය Arequipa මෙන් 10 ගුණයක් විශාලය |
| පිලිපීනය | මැනිලා | දෙවන විශාලතම නගරය Davao මෙන් 10 ගුණයක් විශාලය |
| ආර්ජෙන්ටිනා | බුවනස් අයරස් | දෙවන විශාලතම නගරය Cordoba මෙන් 10 ගුණයක් විශාලය |

| | | |
|---|---|---|
| බ්‍රිතාන්‍ය | ලන්ඩන් | දෙවන විශාලතම නගරය Birmingham මෙන් 5 ගුණයක් විශාලය |
| ජපානය | ටෝකියෝ | දෙවන විශාලතම නගරය Yokohama මෙන් 3 ගුණයක විශාලය |
| ප්‍රංශය | පැරිස් | දෙවන විශාලතම නගරය Marseilles මෙන් 3 ගුණයක් විශාලය |
| මැක්සිකෝව | මෙක්සිකෝ සිටි | දෙවන විශාලතම නගරය Ecatepec මෙන් 5 ගුණයක් විශාලය |
| ඉරානය | ටෙහෙරාන් | දෙවන විශාලතම නගරය Mashhad මෙන් 4 ගුණයක් විශාලය |

මූලාශ්‍රය :- http://every thing2.com/index.pl?node=primate+city

## පරමාර්ථ

මෙම අධ්‍යනයෙහි පරමාර්ථ දෙකකි. එනම්,

1. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රථමතාවයේ ස්වභාවය හඳුනා ගැනීම
2. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රථමතාවයට බල පෑ හේතු හඳුනා ගැනීම

## ක්‍රමවේදය

මෙම විමසුමේ දී ඉහත පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීම සඳහා භාවිතා කරන ලද්දේ ද්විතියික දත්තයන් ය. මේ සඳහා මූලික වශයෙන් ම දත්ත රැස් කරන ලද්දේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ මූලාශ්‍ර මගිනි. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රථමතාවයේ ස්වභාවය හඳුනා ගැනීම සඳහා ජන සංගණන වර්ෂවල වාර්තා ගත දත්ත උපයෝගී කොට ගෙන නාගරික ප්‍රථමතා දර්ශකය, නාගරික ජන සංඛ්‍යා ප්‍රතිශතය සහ සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය ආදිය ගණනය කරන ලදී. මෙය ට අමතර ව මහ බැංකු වාර්තා, අන්තර් ජාලයේ වෙබ් අඩවි සහ විශ්වවිද්‍යාල විද්වතුන්ගේ පර්යේෂණ පත්‍රිකා මගින් දත්ත සහ තොරතුරු රැස් කරන ලදී.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

තුන්වන ලෝකයේ වෙනත් බොහෝ රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද ජනාවාස පද්ධතිය තුළ නාගරික ප්‍රථමතාවය කැපී පෙනෙන ලක්ෂණයකි. නිදහස ලැබීමෙන් පසු බලයට පත් වූ විවිධ රජයන් ප්‍රාදේශීය සංවර්ධන සැළැසුම් හා ක්‍රමෝපායන් ක්‍රියාත්මක කළ ද වර්තමානය වන විට ද ශ්‍රී ලංකාවේ අවකාශීය සංවර්ධනයේ විශාල විෂමතාවයක් පවතී. විශේෂයෙන් බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාව යටත් කර ගැනීමට පෙර ද ස්වදේශීය වශයෙන් නාගරික මධ්‍යස්ථාන පැවතිය ද ශ්‍රී ලංකාව යටත් විජිතයක් බවට පත් වීමෙන් පසු එම නගරවල දේශීය මුහුණුවර වෙනස් විය. ඒ අනුව කොළඹ නගරයේ ප්‍රථමතාවයට මූලික ම පදනම සකස් වන්නේ බ්‍රිතාන්‍ය ජාතිකයන් ශ්‍රී ලංකාව යටත් විජිතයක් ලෙස අල්ලා ගැනීමත් සමග කොළඹ නගරය මව් රට සමග සබඳතා පැවැත්වීම සඳහා පිවිසුම් දොරටු නගරයක් (Gateway) ලෙස තෝරා ගැනීමෙනි. බ්‍රිතාන්‍ය ජාතිකයන් ශ්‍රී ලංකාව යටත් විජිතයක් ලෙස අල්ලා ගැනීමට ප්‍රථම ද 16 වන ශත වර්ෂයේ දී කොළඹ නගරය පෘතුගීසීන් හා ලන්දේසීන් විසින් ද නාවික වරායක් ලෙස භාවිතා කරන ලද අතර එකල ද මෙය ප්‍රධාන වාණිජ හා පරිපාලන මධ්‍යස්ථානයක් වශයෙන් දියුණු කරන ලදී. 1776 දී බ්‍රිතාන්‍ය ජාතිකයන් පැමිණීමත් සමග මෙය ශ්‍රී ලංකාවේ වතු ආර්ථිකයේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් වූ අතර මෙය දුම්රිය හා මහාමාර්ග මඟින් රට අභ්‍යන්තරයේ වූ වෙනත් ප්‍රාදේශීය නාගරික මධ්‍යස්ථාන සමග මෙය සම්බන්ධ කරන ලදී. මේ අනුව කොළඹ නගරය බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ප්‍රධාන වරාය නගරය මෙන් ම වාණිජ, කාර්මික, මූල්‍ය පරිපාලන හා දේශපාලන කටයුතු සඳහා ද ප්‍රධාන මධ්‍යස්ථානය විය. මේ ආකාරයට කාර්යමය වශයෙන් මෙන් ම ජනසංඛ්‍යා වර්ධනයෙන් ද 20වන සියවසේ දී ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වූ කොළඹ නගරයේ ප්‍රථමතාවය, ශ්‍රී ලංකාවේ වෙනත් කිසිදු නගරයකට අභියෝගයට ලක් කිරීමට නොහැකි විය (Wanasinghe, 1995). මේ අනුව 20 වන සියවසේ මැද භාගය පමණ වන විට එනම් 1931 වනවිට ජනසංඛ්‍යාව සම්බන්ධයෙන් කොළඹ නගරය උපරිම ප්‍රථමතා දර්ශකය වාර්තා කරන ලදී. ප්‍රථමතාවය මැනීම සඳහා භාවිතා කරනු ලබන නගර දෙකේ දර්ශකය (2 city index) අනුව 1901 දී 4.1 ක් වූ කොළඹ නගරයේ ප්‍රථමතාවය ක්‍රමයෙන් වැඩි වී 1931 වන විට 6.3 ක් දක්වා උපරිමයකට පත් වී ඇත (වගුව 02).

වගු අංක 02

කොළඹ නාගරික ප්‍රථමතාවය - නගර දෙකේ දර්ශකය (2 City Index)

| සංගණන වර්ෂ | 1901 | 1911 | 1921 | 1931 | 1946 | 1953 | 1963 | 1971 | 1981 | 2001 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ නගරයේ ජනසංඛ්‍යාව (000) | 154 | 211 | 244 | 284 | 362 | 426 | 511 | 562 | 587 | 642 |
| ප්‍රථමතා දර්ශකය (නගර දෙකේ දර්ශකය) | 4.2 | 5.3 | 5.8 | 6.3 | 5.9 | 5.3 | 4.6 | 3.7 | 3.4 | 3.1 |
| දෙවන විශාලතම නගරය | ගාල්ල | යාපනය | යාපනය | මොරටුව | මොරටුව | දෙහිවල-ගල්කිස්ස | | | | |

(සැ.යු. නගර දෙකේ දර්ශකයේ අගය 1ට වඩා වැඩි නම් එහි ප්‍රථමතාවයක් ඇත)
මූලාශ්‍රය :- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

1881 සිට 2001 දක්වා කොළඹ නගරයේ ජීවත් වූ නාගරික ජනසංඛ්‍යාවේ ප්‍රතිශතය විමසා බලන කල්හි 1963 දක්වා මුළු නාගරික ජනසංඛ්‍යාවෙන් 1/4 ක් ම ඒකරාශී වී ඇත්තේ කොළඹ නගරය තුළ ය (වගුව 03). 1931 දක්වා මුළු නාගරික ජනසංඛ්‍යාවෙන් 39%ක් ම කොළඹ නගරය තුළ ජීවත් වී ඇත. මේ අනුව ක්‍රමයෙන් වර්ධනය වී 1931 දී උපරිම තත්ත්වයට පත් වූ කොළඹ නගරයේ ප්‍රථමතාවය 1931 න් පසු ක්‍රමයෙන් පහළ බැසීමේ ප්‍රවනතාවයක් හඳුනා ගත හැකි ය (වගුව 02). මේ අනුව 1931 දී 6.3 ක් වූ නගර දෙකේ ප්‍රථමතා දර්ශකය 1946 වන විට 5.9 ක් දක්වා පහළ බසින ලද අතර 2001 වන විට 3.1ක් දක්වා ක්‍රමයෙන් පහළ බැස ඇත. විසිවන සියවසේ මැද භාගය දක්වා තනි නගරයක් ලෙස වර්ධනය වූ කොළඹ නගරය විසිවන සියවසේ මැද භාගයෙන් පසු වෙනස් මුහුණුවරකින් වර්ධනය වීම මෙලෙස ප්‍රථමතාවය ක්‍රමයෙන් පහළ බැසීමට හේතු වී ඇති ප්‍රධාන සාධකය යි.

වගු අංක 03

කොළඹ නගරයේ ජන සංකේන්ද්‍රණය 1881 - 2001

| වර්ෂය | මුළු නාගරික ජනසංඛ්‍යා ප්‍රතිශතය |
|---|---|
| 1881 | 39 |
| 1891 | 39 |
| 1901 | 37 |
| 1911 | 39 |
| 1921 | 38 |
| 1931 | 39 |
| 1946 | 35 |
| 1953 | 34 |
| 1963 | 24 |
| 1971 | 20 |
| 1981 | 18 |
| 2001 | 26 |

මූලාශ්‍රය :- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

මෙන්ඩිස්, 1981

විසිවන සියවසේ මැද භාගය පමණ වනතුරුත් කොළඹ නගරය තනි නගරයක් ලෙස වර්ධනය වුව ද ඉන් පසු කොළඹ නගරය අවට දෙහිවල-ගල්කිස්ස, මොරටුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වැනි උපනගර වර්ධනය වීමෙන් උපනගරෝපාන්තකරණයට ලක් වීම තනි නගරයක් ලෙස කොළඹ නගරයේ ප්‍රථමතා ලක්‍ෂණ අඩු වීමට හේතු වී ඇත (වගු අංක 5). 1948 දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලබන විට කොළඹ නගරය වටා උපනගර අඩ කවයක් බිහි වී තිබූ අතර කොළඹ නගරයේ පැවති අධික ජනසංඛ්‍යා වර්ධනය නිසා උද්ගත වූ විවිධ ගැටළු නිසාවෙන් හා උපනගරවල පැවති විවිධ ආකර්ෂණීය තත්ත්වයන් නිසා කොළඹ නගරය තුළ වූ බොහෝ ජනයා උපනගරවලට සංක්‍රමණය විය. විශේෂයෙන් ම කොළඹ නගරය සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික මධ්‍යස්ථානයක් වුව ද සමහර කාර්යයන් එනම් කර්මාන්ත, වාණිජ්‍ය හා මූල්‍ය කටයුතු කොළඹ නගරයෙන් පිටතට විකේන්ද්‍රණය කිරීම මෙම උපනගර අඩකවය

වර්ධනය වීමට හේතු විය. මෙම උපනගර මූලික වශයෙන් ම වර්ධනය වූයේ නේවාසික උපනගර (Residential Suburbs) ලෙස වුව ද පසු කාලීන ව ඒවායේ ද නාගරික කාර්යයන් සංකේන්ද්‍රණය වී රැකියා සපයන උපනගර (Employing Suburbs) බවට පත්විය.

1971 පමණ වන විට පැරණි උපනගර අඩකවය ප්‍රජාවිද්‍යාත්මක වශයෙන් හා කාර්යමය වශයෙන් පරිණත තත්ත්වයට පත් ව තිබූ අතර 1971න් පසු පැරණි උපනගර අඩකවය වටා නව උපනගර අඩකවයක් වර්ධනය වන්නට විය. එනම් බත්තරමුල්ල, රාගම, හැඳල, වැලිසර, මහරගම, දළුගම, කඳාන, ජා-ඇල, කොටිකාවත්ත, කැළණිය, මුල්ලේරියාව යන නගර නව උපනගර ලෙස වර්ධනය වන්නට විය, මම නව උපනගර අඩකවයට ද අඩු මිලට ඉඩම් ලබා ගත හැකි වීම, මනා සුගමතාවයකින් යුක්ත වීම හා ගැමිරික ලක්ෂණ වලින් යුක්ත වීම ආදී හේතු නිසා ග්‍රාමීය නාගරික සංක්‍රමණිකයන්ට විශාල ආකර්ෂණයකින් යුක්ත විය. එබැවින් මෙය ද ලංකාවේ වෙනත් පර්යන්ත ප්‍රදේශවල පවතින මානව හා භෞතික සම්පත් ආකර්ෂණය කර ගනිමින් වර්ධනය විය (Wanasinghe, 1985, Deheragoda et al, 1992).

වර්තමානයේ දී කොළඹ නගරය, කොළඹ පැරණි උපනගර අඩකවය සහ නව උපනගර අඩකවය ද සහිතව "කාර්යක්ෂම නාගරික කලාපයක්" (Functional Urban Region) ලෙස වර්ධනය වී ඇත. මෙලෙස කොළඹ අවට මෙම උප නගර අඩකවය වර්ධනය වීම කෙරෙහි රජයේ සංවර්ධන ප්‍රතිපත්ති ද බල පා ඇති බව ඉතා පැහැදිලි ව පෙනේ. නිදහසින් පසු බලයට පත් වූ රජයන් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී කර්මාන්ත විකේන්ද්‍රණය සඳහා මෙම උපනගර තෝරා ගැනීම මේවායේ වර්ධන විභවතාවය තවත් ඉහළ නැංවීමට ප්‍රධාන හේතුවක් විය. මේ අනුව රජය විසින් මෙම උපනගරවල විවිධ කර්මාන්ත එනම්, ටයර් හා ටියුබ්, යකඩ හා වානේ, පෝසිලේන්, තෙල් පිරිපහදු කිරීම ආදී විවිධ කර්මාන්ත ස්ථාන ගත කරන ලදී. මීට අමතරව 1977 න් පසු රජය විසින් කටුනායක සහ බියගම වැනි ආයෝජන ප්‍රවර්ධන කලාප සහ ඒකල වැනි කර්මාන්ත ජනපද පිහිටුවීම මෙම කලාපයට දේශීය මෙන් ම විදේශීය ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට හේතු විය. එමෙන් ම කොළඹ නගරය අවට උපනගර වර්ධනය වීමට බල පෑ තවත් ප්‍රබල හේතු සාධකයක් වන්නේ පරිපාලන කටයුතු විමධ්‍යගත කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය. මෙහි දී කොළඹ ප්‍රධාන නගරය වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන්

වර්ධනය කොට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව පරිපාලන අගනගරය වශයෙන් දියුණු කිරීමට අරමුණු කරන ලදී. මේ අනුව එම ප්‍රදේශයට විශාල වශයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කරන ලද අතර ඊට සමගාමී ව නේවාසික, වාණිජ, මූල්‍ය හා කාර්මික කටයුතු සංකේන්ද්‍රණය වීම ද සිදු විය. මේ අනුව වර්තමානය වන විට මෙම කාර්‍යක්‍ෂම නාගරික කලාපයට ගම්පහ දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය හා කළුතර දිස්ත්‍රික්කයේ දකුණු හා බටහිර කොටස් ද ඇතුළත් වන අතර එය ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ මධ්‍යස්ථානය බවට පත් වී ඇත (Wanasinghe, 2001). නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙය කොළඹ පුරවර ප්‍රදේශය (Colombo Metropolitan Region) ලෙස ප්‍රකාශයට පත් කොට ඇත (සිතියම 01).

මේ අනුව තනි නගරයක් ලෙස 1931 වනතුරු කොළඹ නගරයේ ප්‍රථමතාවය 1931 න් පසු ක්‍රමයෙන් අඩු වීමේ ප්‍රවනතාවය නිරීක්‍ෂණය කළ හැකි වුව ද 1931 න් පසු සිදු වී ඇත්තේ කොළඹ පුරවර ප්‍රදේශයේ ප්‍රථමතාවය ක්‍රමයෙන් වර්ධනය වීමයි. වගු අංක 04ට අනුව 1971 සිට 1981 දක්වා වසර 10ක කාලයක් තුළ කොළඹ මහ නගර සභාවේ ජනසංඛ්‍යාව වෙනස් වී ඇත්තේ 4.5%ක් වැනි අඩු අගයකිනි. එහෙත් 1971 සිට 1981 දක්වා වසර 10 තුළ සෑම උපනගරයක ම ජනසංඛ්‍යාව ඉතා ඉහළ අගයකින් වර්ධනය වී ඇති අතර මෙම ප්‍රවණතාවය 1981 සිට 2001 දක්වා වසර 20 තුළ තව තවත් ඉහළ ගොස් ඇත. මේ අනුව 1981 සිට 2001 දක්වා වසර 20 තුළ කොළඹ නගරයේ ජනසංඛ්‍යාව 9.3% කින් වෙනස් වී ඇති අතර අන් සෑම උපනගරයක් ම 1971-1981 වසර 10 තුළ වාර්තා කළ වැඩි වීමට වඩා ඉතා ඉහළ අගයකින් වෙනස් වී ඇත. මේ අනුව ඉතා පැහැදිලි වන කරුණක් වන්නේ 1931 දී පමණ කොළඹ නගරයේ ප්‍රථමතාවය කොළඹ පුරවර ප්‍රදේශයේ ප්‍රථමතාවය බවට පත් වී ඇති බවයි. පහත සඳහන් වගු වලින් මෙය ඉතා පැහැදිලි ව හඳුනා ගත හැකි අතර වර්තමානයේ දී කොළඹ පුරවර ප්‍රදේශය දෙවන විශාලතම නගරය මෙන් 34 ගුණයක් විශාලත්වයෙන් යුක්ත ය.

වගුව 04

කොළඹ උපනගරවල ජනසංඛ්‍යා වර්ධනය

| නගරය | 1971 - 1981 ජනසංඛ්‍යාවේ වෙනස් වීමේ ප්‍රතිශතය | 1981-2001 ජනසංඛ්‍යාවේ වෙනස් වීමේ ප්‍රතිශතය |
|---|---|---|
| කොළඹ මහනගර සභාව | 4.5 | 9.3 |
| **පැරණි උපනගර** | | |
| දෙහිවල-ගල්කිස්ස | 12.5 | 20.9 |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 7.9 | 14.6 |
| මොරටුව | 40.1 | 56.5 |
| කොළොන්නාව | 9.6 | 35 |
| වත්තල - මාබෝල | 4.4 | 48 |
| **නව උපනගර** | | |
| බත්තරමුල්ල | 27.9 | * |
| රාගම | 26.6 | * |
| හැඳල | 24.5 | * |
| වැලිසර | 28.7 | * |
| මහරගම | 19.2 | * |
| දළුගම | 12.1 | * |
| කඳාන | 14.1 | * |
| ජා ඇල | 12.8 | * |
| කොටිකාවත්ත | 10.2 | * |
| කැළණිය | 42.5 | * |
| මුල්ලේරියාව | 8.9 | * |

*1987න් පසු මෙම සුළුනගර සභා ප්‍රාදේශීය සභා බවට පත් විය.

මූලාශ්‍රය- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

වගු අංක 05

කොළඹ පුරවර ප්‍රදේශයේ ප්‍රථමතාවය


| විස්තරය | ජනසංඛ්‍යාව-1981 | ජනසංඛ්‍යාව-2001 |
|---|---|---|
| කොළඹ පුරවර ප්‍රදේශය (CMR)- P1 | 3919807 | 5361185 |
| දෙවන විශාලතම නගරයේ ජනසංඛ්‍යාව -P2 | යාපනය 118215 | මහනුවර 156923 |
| නගර දෙකේ ප්‍රථමතා දර්ශකය P1/P2 | 33.18 | 34.16 |

මූලාශ්‍රය- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

කොළඹ පුරවර ප්‍රදේශය පර්යන්ත ප්‍රදේශයෙහි මානව හා භෞතික සම්පත් ඉතා විශාල වශයෙන් ආකර්ෂණය කරගනු ලබයි. ඉතා නවීන වරාය පහසුකම් නිසා 90%ක් ම ජාත්‍යන්තර වෙළඳම් කටයුතු කරනු ලබන්නේ මෙ මඟිනි. එමෙන් ම ජාත්‍යන්තර බැංකුවලින් 95%ක් ම මෙහි ස්ථාන ගත වී ඇති අතර කර්මාන්තවලින් 81% ක් පමණ ද (Central Bank, 2001) විද්වත් හා කාර්මික පුහුණු ශ්‍රමිකයන් ඉතා විශාල ප්‍රමාණයක් ද ඉතා නවීන තාක්‍ෂණික හා සන්නිවේදන පද්ධතියක් ද නවීන ගුවන් තොටුපල හා ඉහළ ගණයේ භාණ්ඩ හා අධ්‍යාපන, සෞඛ්‍ය වැනි ඉහළ ගණයේ සේවා පහසුකම් ද ඉතා විශාල ලෙස සංකේන්ද්‍රණය වී ඇත. මෙලෙස කොළඹ පුරවර ප්‍රදේශයේ පවතින මෙම තත්ත්වය මිර්දාල් (Myrdal, 1957) ඉදිරිපත් කළ ආදර්ශය හා සමාන වේ. මිර්දාල් ඔහුගේ ආදර්ශයෙන් පෙන්නුම් කරන්නේ වාණිජ, මූල්‍ය, පරිපාලන කටයුතු මෙන් ම භාණ්ඩ හා සේවා ද යටිතල පහසුකම් ද අධික ලෙස සංකේන්ද්‍රණය වීමෙන් හර ප්‍රදේශයක ඇතිවන ගුණක ඵල (Multipler effect) රටේ පර්යන්ත ප්‍රදේශවල පවතින පුහුණු ශ්‍රමය, ප්‍රාග්ධනය හා අමුද්‍රව්‍යය ආකර්ෂණය කර ගනිමින් "පිළිසෝද ඵල" (Back wash effects) ඇති කරන බවයි. හර්ච්මන් (Hirschman, 1958) පෙන්වා දෙන ආකාරයට හරයේ මෙම ක්‍රියාකාරීත්වය "ධ්‍රැවායන" ක්‍රියාවලිය ඇති වීමට හේතුවේ. මිර්දාල් (Myrdal) සහ හර්ච්මන් (Hirschman) පෙන්වා දෙන ආකාරයට මේ තුළින් "පැතිරීමේ ඵලවලට" වඩා "පිළිසෝදා ඵල" වැඩි වීම හරය සහ පර්යන්තය අතර විශාල සංවර්ධන විෂමතාවයක් හට ගැනීමට හේතු වේ.

සිතියම 01

## කොළඹ පුරවර ප්‍රදේශය




මේ අනුව වනසිංහ (Wanasinghe, 2001) සඳහන් කරන ආකාරයට කොළඹ පුරවර ප්‍රදේශයේ සියළු පහසුකම් සංකේන්ද්‍රණය වීම නිසා ඇති වී තිබෙන ගුණක ඵල ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශවල පවතින තරුණ ශ්‍රමය හා ප්‍රාග්ධනය හරය කරා ඇද ගැනීමට හේතු වී ඇත.

මිර්දාල් (Myrdal) පෙන්වා දෙන පරිදි පර්යන්තයේ සංවර්ධනයට බාධාවක් වන පිළිසෝදා ඵල ඇති වීම වැළැක්වීම සඳහා සැළැසුම් ක්‍රියාත්මක කිරීමේ දී රජයේ මැදිහත් වීම අවශ්‍ය වේ. හර්ෂ්මන්ට (Hirschman, 1958) අනුව ධ්‍රැවායනය අඩු කරමින් පර්යන්තය දියුණු කිරීම සඳහා උපාය මාර්ග වශයෙන් රජය විසින් කර්මාන්ත විකේන්ද්‍රණය කිරීම, යටිතල පහසුකම් වර්ධනය කිරීම, ව්‍යාපාරිකයන්ට බදු සහන ලබාදීම ආදිය වැදගත් වේ.

මේ අනුව ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රථමතාවය අඩු කරමින් පර්යන්ත ප්‍රදේශ සංවර්ධන කිරීම සඳහා නිදහසින් පසු බලයට පත් වූ සෑම රජයක් ම විවිධ ප්‍රතිපත්ති හා සැළැසුම් ක්‍රියාත්මක කරන ලදී. මෙහි දී පර්යන්ත ප්‍රදේශවල ජනතාවගේ ආදායම වර්ධනය කරමින් ගුණාත්මක ජීවන තත්ත්වයක් ලබා දීම එම උපාය මාර්ගවල පරමාර්ථය විය. මේ අනුව පසුගිය වසර 50ක පමණ කාලය තුළ පර්යන්ත ප්‍රදේශවලට භෞතික හා සමාජ යටිතල පහසුකම් සැපයීම, සමාජ සුභසාධනය මගින් පර්යන්තයේ භෞතික ජීවන තත්ත්වය ඉහළ නැංවීම, දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන්, වියළි හා තෙත් කලාපවල ගොවි ජනපදකරණය ඉඩම් හා නිවාස සංවර්ධනය, කර්මාන්ත විකේන්ද්‍රණය කිරීම, විදේශීය ආධාර මඟින් ග්‍රාමීය සංවර්ධනය කිරීම, බැංකු කටයුතු විකේන්ද්‍රණය කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ නගර දියුණු කිරීම ප්‍රාදේශීය සංවර්ධනය සඳහා බලය විමධ්‍ය ගත කිරීම ආදී විවිධ උපායමාර්ග, හරය සහ පර්යන්තය අතර තිබෙන සංවර්ධන විෂමතාවය අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලදී.

## නිගමනය

ඉහත කරුණු විමසා බැලීමේ දී පැහැදිළි ව පෙනීයන දෙයක් වන්නේ ලෝකයේ බොහෝ රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද ජනාවාස පද්ධතියේ නාගරික ප්‍රථමතාවය ඉතා ප්‍රබල ලෙස කැපී පෙනෙන බවයි. රටක ජනාවාස පද්ධතියේ ප්‍රථමතාවය තුන්වන ලෝකයේ රටවල ට විටෙක වාසිදායක තත්ත්වයක් ගෙන ආව ද වර්තමානයේ පවතින අත්දැකීම් අනුව මෙමඟින් රටක ප්‍රාදේශීය සංවර්ධනයේ දැඩි අසමතුලිතතාවයක් ඇති කරනු ලබයි. එබැවින් ප්‍රථමතා ලක්ෂණ අවම කරමින් ප්‍රාදේශීය සංවර්ධනය සිදු වීම ඉතා වැදගත් වේ. මේ අනුව පසු ගිය දශක 5ක

පමණ කාලය තුළ කොළඹ නගරයේ ධ්‍රැවායනය අඩු කිරිම සඳහා ත් පර්යන්තයේ සංවර්ධනය සඳහා ත් විවිධ උපාය මාර්ග රජය විසින් ක්‍රියාත්මක කර ඇත. මෙමඟින් යම්තාක් දුරකට අරමුණු ඉෂ්ඨ වුව ද හර ප්‍රදේශය හා පර්යන්තය අතර සංවර්ධන පරතරය තවමත් සැළැකිය යුතු ලෙස අඩුවීමක් දැක ගත නොහැකි ය. වර්තමානය වන විට සිදු ව ඇත්තේ කොළඹ තනි නගරයක් ලෙස නොව පුරවර ප්‍රදේශයක් බවට පත් වී "පුරවර ප්‍රථමතාවයක්" (Primacy of Colombo Metropoliton Region) නිර්මාණය වීමයි. එබැවින් පුරවර ප්‍රථමතාවය අඩුකරමින් රට තුළ සංවර්ධනයේ සමතුලිතතාවයක් ඇති කිරීම සඳහා නව සංවර්ධන ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකැසීම ඉතා අත්‍යාවශ්‍ය වන අතර එසේ නොවුවහොත් හරය හා පර්යන්තය අතර සංවර්ධන පරතරය තව දුරටත් ඉහළ යනු ඇත.

## ආශ්‍රිත මූලාශ්‍ර


Baskin, C.W (1966), Central Place Theory in Southern Germany, Translation of W. Christaller (1933), Englewood Cliffs,L.J:Prentice-Hall.

Becker, Charles et al., (1992), African City Systems and Urban Growth, Heinemann Publishers, New Hampshire.

Central Bank of Sri Lanka, Annual Report (2001), Colombo.

Deheragoda, C.K.M.,Wanasinghe, Y.A.D.S and Karunanayake, M.M. (1992),Urban Growth in Sri Lanka: Implications for Regional Development, UNCRD Working Paper No 92-4, United Nations Center for Regional Development, Nagoya, Japan.

Department of Census and Statistics, Census of Population and Housing, 1981, 2001, Ministry of Finance and Planning, Colombo.

Henderson, J.V., (2002), Urbanization in Developing Countries, The World Bank Research Observer.

Hirshman, Albert O., (1958), The Strategy for Economic Development, Yale Univrsity Press, New Haven. Ct.

http://everything2.com/index.pl?node=primate+city&lastnode_id=124&searchy=search

Miller, Jared, Perpetual Cities: The Roots of Primacy in the Third World available at http://s01.middlebury.edu/EC428A/Conferences/Urbanization/2001/Miller-urban.htm

Mendis, M.W.J.G., (1982), Urbanization and Urban Development in Sri Lanka, Office of Housing and Urban Programs: Sri Lanka.

Mutlu, Servet., (1989), Urban Concentration and Primacy Revisited: An Analysis and Some Policy Conclusions in Economic Develeopment Cultural Change, Vol.37 No.3 Apri.

Myrdal, Gunnar, (1957), Economic Theory and Under Developed Regions, Duckworth, London.

Richardson, Harry, W., (1993), Efficiency and Welfare in LDC Mega Cities in John D. Kasarda and Allan M.Parnall (ed), Third Word Cities: Problems, Policies and Prospects, Sage Focus Editions No.148, Sage Publications, Newbury Park, California.

United Nations Development of Economic and Social Affairs/ Population Division, (2004), World Urbanization Prospects: The 2003 Revision, NewYouk: United Nation Publication.

Wanasinghe, Y.A.D.S., (1985), Suburbanization around Colombo: A Preliminary Survey, Vidyodaya Journal of Arts, Science and Letters, Vol 13, No.2, Colombo.

Wanasinghe, Y.A.D.S., (1995), Urban Growth and Recent Urbanization Trends in Sri Lanka in Mauri Palomaki and J.A. Karunaratne (ed), Acta Wasanesia No 45, Geography 6, Vaasa Finland.

Wanasinghe, Y.A.D.S., (2001), Regional Imbalances in Sri Lanka: A Critique of Regional Development Policies and Strategies in M. M. Karunanayake (ed) People, Space and Resources: Perspectives on Development Issues in Rural Sri Lanka, Department of Geography, University of Sri Jayewardenepura-Sida/SAREC Research Cooperation Project.